# නො පිළිගැනුණු හා පිළිගැනුණු වික්‍රමසිංහ

මාර්ටින් වික්‍රමසිංහ මහතා බුදුදහම ගැන ලියා ඇති සමහර දැඩි වැරදි පෙන්වා දුන් භික්ෂූන් වහන්සේ වූ හ. පූජ්‍ය යක්කඩුවේ ප්‍රඥාරාම හිමි, පූජ්‍ය කන්නිමහර සුමංගල හිමි වැනි භික්ෂූන් වහන්සේ එහි දී ප්‍රධාන තැනක් ගත් හ. බුදුදහම පිළිබඳ උන්වහන්සේලා සතු දැනුම අති මහත් විය. මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ මත ඛණ්ඩනය කිරම උන්වහන්සේට අසීරු කරුණක් නො වී ය. එහෙත් මෙරට සමාජය විසින් පිළිගනු ලැබුයේ මාර්ටින් වික්‍රමසිංහ මහතා මිස උන්වහන්සේ නො වෙයි. එයට හේතුව කුමක් ද යන්න පිළිබඳව ද අප මෙහි දී සුළුවෙන් හෝ කතා කළ යුතු ය.

මෙහි දී වැදගත්වන ප්‍රධාන වචනයක් නම් සමාජය යන්න ය. මෙරට සමාජය විසින් පිළිගනු ලැබුයේ යැයි කියන විට සමාජය යනුවෙන් අදහස් කෙරන්නේ කුමක් ද? ඒ නාගරික මධ්‍යම පංතිය ආශ්‍රිත සමාජයක් මිස ඈත ගම්මානවල ජීවත්වන ගැමි සමාජයක් නො වේ. ගැමි සමාජය මාර්ටින් වික්‍රමසිංහ මහතා ගැන ඇතැම් විට කිසිවක් දැන නො සිටින්නට ඇත. නාගරික මධ්‍යම පංතිය යැයි කීව ද, එහි සියල්ලන් ම නගරවල ජීවත් වූ බවක් මෙයින් අදහස් නො වෙයි. ඒ සමාජයෙහි ඉතා වැඩි පිරිසක් නගරවල වාසය කරන්නට ඇති බවට සැකයක් නැත. එහෙත් ගම්වල ද ඒ සමාජයට අයත් වූවෝ සිටිය හ.

යම් ආකාරයක බටහිර අධ්‍යාපනයක් ලබා බටහිර නූතනත්වයෙහි අන්තේවාසිකයන් බවට පත් වූ ගම්වල ජීවත්වන්නෝ ද මේ සමාජයට අයත් වූ හ. මේ මධ්‍යම පංතික සමාජය සකස් කරනු ලැබුයේ මූලික වශයෙන් ම අධ්‍යාපනය මගිනි. බ්‍රිතාන්‍යයෝ හිතාමත ම අවුරුදු දහස් ගණනාවක් මෙරට තිබූ අධ්‍යාපන ක්‍රමය වැනසීමට කටයුතු කළ හ. ඒ සඳහා ඔවුහු නව අධ්‍යාපන ක්‍රමයක් යොදාගත් හ. එය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ අධ්‍යාපනයයි. බ්‍රිතාන්‍යයෝ මුළු රට පුරා ම ප්‍රචලිත කෙළේ මේ අධ්‍යාපනය ය. ඒ අධ්‍යාපනය හරහා විශාරදයන් බිහි කිරමට වඩා මේ වගකිවයුත්තන්ට අවශ්‍ය වුයේ සුද්දන් වෙනුවට සුද්දන්ගේ ඇතැම් වැඩ ඒ ආකාරයෙන් ම කළ හැකි පිරිසකි.

කන්නන්ගර මහතා නිදහස් අධ්‍යාපනය හඳුන්වා දීමට පෙර ද මෙරට නිදහස් අධ්‍යාපනයක් විය. පැරණි සිංහල බෞද්ධ අධ්‍යාපනය ද නිදහස් අධ්‍යාපනයක් විය. බ්‍රිතාන්‍යයන් විසින් ආරම්භ කරනු ලැබූ පාසල්වල සිංහලෙන් දෙනු ලැබූ අධ්‍යාපනය ද නිදහස් අධ්‍යාපනයක් විය. ඔවුන් මුදල් අය කෙළේ ඉංගිරිසි මාධ්‍යයෙන් දෙනු ලැබූ අධ්‍යාපනයට ය. කන්නන්ගර මහතා විසින් නිදහස් කරනු ලැබුයේ එසේ ඉංගිරිසි මාධ්‍යයෙන් දෙනු ලැබූ අධ්‍යාපනය..ය.

බ්‍රිතාන්‍යයන් සිංහල මාධ්‍යයෙන් දෙනු ලැබූ අධ්‍යාපනය සඳහා පාසල් ඇති කළා පමණක් නො වෙයි. ඔවුහු ශිෂ්‍යයන් ඒ පාසල්වලට නිතිපතා පැමිණෙන්නේ ද යන්න ද සොයා බැලූ හ. පාසල් නො එන සිසුනට නඩු දැමීම සඳහා දැනට දශක හත අටකට පෙර නඩු දමන මහත්වරු යනුවෙන් නිලධාර පිරිසක් ඒ පාසල්වලට පැමිණිය හ. බ්‍රිතාන්‍යයන් මෙරට ශිෂ්‍යයන්ට ඉගැන්වීමට එතරම් උනන්දුවක් ගත්තේ ඇයි? අප ඒ ප්‍රශ්නයට පිළිතුරක් දිය යුත්තේ මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ සිට එක්ස් කණ්ඩායම දක්වා සියල්ලන් බිහි කිරීමට බ්‍රිතාන්‍යයන්ගේ මේ උනන්දුව අවසානයේ දී ප්‍රධාන හේතුවක් වූ බැවිනි.

පැරණි සිංහල බෞද්ධ සමාජයෙහි දක්නට ලැබුණු ප්‍රධාන ලක්ෂණයක් වුයේ අධ්‍යාපනය ප්‍රධාන වශයෙන් ම භික්ෂූන් වහන්සේ අත තිබීම ය. එකල ගිහි උගතුන් නො සිටියා නො වේ. අපවත් වී වදාළ පූජ්‍ය බද්දේගම විමලවංශ නා හිමියන් පෙන්වා දී ඇති ආකාරයට ගිහියන් ද පැරණි අධ්‍යාපනයෙහි යම් කාර්යභාරයක් ඉටු කර ඇත. එකල පොත පත ලියූ ගිහි උගත්තු ද වූ හ. එහෙත් භික්ෂූන් වහන්සේ පැරණි සිංහල බෞද්ධ අධ්‍යාපනය ලබා දීමේ දී පෙරමුණේ සිටිය හ. භික්ෂූන් වහන්සේ වෙනත් රටක මෙන් නො ව ලංකාවේ සිංහල ථෙරවාද බෞද්ධ සමාජයෙහි ගුරුවරු ද වූ හ.

භික්ෂූන් වහන්සේ සිටින තෙක් මෙරට සම්පූර්ණයෙන් ම පරාධීන කළ නොහැකි බව බ්‍රිතාන්‍යයෝ තේරුම් ගත් හ. උන්වහන්සේලා සිංහල බෞද්ධ සමාජයෙහි ගුරුවරුන් වීම උන්වහන්සේලාට සමාජයෙහි තිබූ ගෞරවයට ප්‍රධාන හේතුවක් විය. පරලොව වශයෙන් පමණක් නො ව මෙලොව වශයෙන් ද සිංහල බෞද්ධයෝ භික්ෂූන් වහන්සේගෙන්

ගුරුපදේශ බලාපොරොත්තු වූ හ. බ්‍රිතාන්‍යයන්ට මූලික වශයෙන් ම අවශ්‍ය වූයේ සමාජයෙහි භික්ෂූන් වහන්සේට තිබූ මේ වටිනාකම (ගෞරවය) නැතිකිරම ය. බ්‍රිතාන්‍යයන් මෙරට පාසල් ඇති කර ඉගැන්වීමට එතරම් උනන්දුවක් දැක්වූයේ සිංහලයන්ට භික්ෂූන්වහන්සේ නො වන වෙනත් ගුරුවරු පිරිසක් අපට ලබා දීමට ය.

බ්‍රිතාන්‍යයන් විසින් ආරම්භ කරන ලද පාසල්වල ප්‍රධාන පරීක්ෂක (අද නම් අධ්‍යාපන අධ්‍යක්ෂ ජෙනරාල්) වූයේ මෙරට ඇංග්ලිකන් පල්ලියේ ප්‍රධාන පූජකවරයා ය. විෂය නිර්දේශ ආදිය සකස් කෙරුණේ ඇංග්ලිකන් පල්ලියේ හා බ්‍රිතාන්‍ය අධ්‍යාපනඥයන්ට අවශ්‍ය ආකාරයට ය. ඒ පාසල්වල දෙනු ලැබූ අධ්‍යාපනය රැකියාව සමග බද්ධ කෙරුණු බැවින් හා බ්‍රිතාන්‍ය ආර්ථික ව්‍යුහය විසින් මිනිසුන් කරන රැකියා තීරණය කෙරුණු හෙයින් පාසල් අධ්‍යාපනයෙහි වටිනාකම වැඩි විය. එසේ වැඩි වූයේ භික්ෂූන්වහන්සේට අමතරව ගුරුවරුන් නමින් ගිහියන් පිරිසක් ද ඇති කරනු ලැබීමත් සමග ය.

ආරම්භයේ දී මේ ගුරුවරු සිංහල බෞද්ධ ක්‍රමයෙන් එතරම් පිට නො ගිය හ. පැරණි පොතපත අධ්‍යයනය කිරම එයට ප්‍රධාන හේතුවක් විය. එහෙත් සිංහල සමාජය බටහිරකරණය කිරමේ මුල් පියවර ගත්තෝ ද මේ ගුරුවරු වූ හ. අධ්‍යාපනය

රැකියාවට ගැටගැසීම හේතුවෙන් ක්‍රමයෙන් සාහිත්‍යය, ඉතිහාසය ආදී විෂය වැඩකට නැති විෂය බවට පත් විය. බදියුද්දීන් මොහොමඩ් මහතා අධ්‍යාපන ඇමති පදවියට පත්වීමෙන් පසු ඒ විෂය පාසල් අධ්‍යාපනයෙන් ඉවත් කිරමට පියවර ගැනිණි.

භික්ෂූන් වහන්සේට මෙරට සමාජයෙහි තිබූ වැදගත්කම නැති කෙරුණේ උන්වහන්සේගෙන් ගුරුකම ටිකෙන් ටික ඈත් කිරමෙනි. භික්ෂූන් වහන්සේට තිබූ වටිනාකම නැති කිරමෙන් පසු පැමිණියේ සිංහල ගුරුවරයාගේ වාරය ය. නිදහස් ඉංග්‍රීසි අධ්‍යාපනය ගමට යෑමේ ප්‍රතිඵලය වූයේ ඉංගිරිසි ගුරුවරයා විසින් ගමේ දී ම සිංහල ගුරුවරයා පරාජය කරනු ලැබීම ය. මධ්‍ය මහා විද්‍යාල ගමට යෑමට පෙර ඉංගිරිසි ආධිපත්‍ය පැවතියේ නගරවල ය. වෙද මහතාගේ වටිනාකම ද දොස්තර මහතාගේ වටිනාකම හමුවේ වාෂ්ප කර හැරිණි.

පනස් හයේ සඟ වෙද ගුරු සටන් පාඨය වටා එක්රොක් වූයේ එලෙස බලය කප්පාදු කෙරෙමින් සිටි පිරිසක් ය. ඒ වන විට ද අධ්‍යාපනය භික්ෂූන්වහන්සේගෙන් පැහැරගෙන තිබූ අතර ඉංගිරිසියෙන් ඇති දේ සිංහලෙන් කියන්නන්ට සමාජ වැදගත්කමක් ලැබී තිබුණි. සිංහලයන්ගේ සිතුම් පැතුම් හැඩගැස්සීම ඉංගිරිසි උගතුන්ට කෙමෙන් භාර විණි. මෙරට පළමු එක්ස් කණ්ඩායම (අපි ඔවුනට ඒ කණ්ඩායම යැයි කියමු), එනම් ඉංගිරිසියෙන් හෝ වෙනත් යුරෝපීය භාෂාවකින් ඇති දැනුම සිංහලෙන් පුනරුච්චාරණය කළ පළමු කණ්ඩායම, දහ නවවැනි සියවස අගභාගයේ දී ඇතිවන්නට හැකියාව තිබුණි. ඒ කණ්ඩායම ඇති වීමේ දී ඕල්කට් බුද්ධාගම ද යම් කාර්යභාරයක් ඉටු කර ඇති බව පැහැදිලි ය.

විද්‍යෝදය, විද්‍යාලංකාර පිරිවෙන්වලින් ඉහළ ම ශ්‍රේණියේ පඬිවරුන් දහ නව වැනි සියවසේ අග භාගයේ සිට බිහි වුව ද, උන්වහන්සේලාට සමාජයෙන් ලැබුණු වැදගත්කම ටිකෙන් ටික අඩුවන්නට පටන්ගත් අතර ඒ බී කණ්ඩායම්වල සාමාජිකයන්ට ලැබුණු වැදගත්කම වැඩි වන්නට විය. සිංහල පමණක් දත් පිරිස අතර දහ නවවැනි සියවසේ අගභාගයේ හා විසිවැනි සියවසේ පළමු දශක තුනෙහි පිරිවෙන් අධ්‍යාපනය ලද පඬිවරුන්ගේ තත්ත්වය ඒ බී කණ්ඩායම්වල සාමාජිකයන්ගේ සමාජයීය තත්ත්වයට වැඩි වුව ද ඉන්පසු ඒ ක්‍රමයෙන් අඩුවන්නට පටන් ගත්තේ යැයි සිතිය හැකි ය. එයට එක් හේතුවක් වූයේ 1925 දී ඇති කරන ලද විශ්වවිද්‍යාලයීය ආයතනය වුව ද ප්‍රධාන හේතුව වූයේ අනෙකකි.

සමාජයක වැදගත්කමක් ලැබෙන්නේ පිළිගැනෙන්නේ ඒ සමාජයට අවශ්‍ය පුද්ගලයන්ට, මතවාදවලට ය. ඒ ප්‍රකාශය පුනරුක්තියක් (repetition)- ලෙස පෙනුණ ද ඒ එසේ නො වේ. ඒ පුනරුක්තියක් ලෙස පෙනෙන්නේ එහි දී සමාජය ම සමස්තයක් ලෙස ගෙන නිගමනයකට පැමිණෙන බැවින් ය. යම් උපකල්පනයකින් පටන්ගෙන න්‍යාය හා තර්කය යොදා ගනිමින් වෙනත් නිගමනයකට එළඹීමේ දී පුනරුක්තියක් සේ නො පෙනුණ ද, පද්ධතියක් සමස්තයක් ලෙස සලකා නිගමනවලට එළඹෙන විට එහි පුනරුක්තියක් වේ ය යන අදහස ඇති වෙයි.

© Prof. Nalin De Silva

පෘතුගීසින්ගේ පැමිණීමෙන් පසු මෙරට ක්‍රමයෙන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට යට වීමට පටන්ගති. බ්‍රිතානි පාලන සමයෙහි ඒ ක්‍රියාදාමය තව තවත් වැඩි විය. දහ නවවැනි සියවසේ අග භාගයෙහි බෞද්ධ පුනරුදය යැයි හැඳින්වෙන්න, විද්‍යෝදය, විද්‍යාලංකාර පිරිවෙන් ඇති වීම ආදිය ඒ ක්‍රියා දාමයට එරෙහි ව දැක්වූ ප්‍රතික්‍රියාවක් විය. එහෙත් ඒ ප්‍රතික්‍රියාව ද අවසාන වශයෙන් ක්‍රියාත්මක වූයේ ඔල්කට් බෞද්ධයන් යටතේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව අච්චුව තුළ ම ය. එබැවින් ඒ ක්‍රියාදාමයට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එරෙහි ව සාර්ථකව සටන් කිරමට නො හැකි විය.

ක්‍රමයෙන් ස්ථාපිත වෙමින් පැවති බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අවශ්‍ය වූයේ ඒ නූතනත්වයෙහි බුද්ධිමතුන් මිස එයට පටහැණි බුද්ධිමතුන් නො වෙයි. එබැවින් දෙවනුව කී බුද්ධිමතුන්ට යම් පිළිගැනීමක් මුල දී තිබුණ ද ක්‍රමයෙන් ඒ යටපත් වන්නට විය. ඒ බුද්ධිමතුන් යටපත් වීමත් සමග නැගී සිටියෝ අප විසින් ඒ බී ආදී වශයෙන් හඳුන්වනු ලබන කණ්ඩායම්වල උගත්තු වූ හ. එහි දී එක් පිරිසක් විසින් ගෙන එනු ලබන තර්කවල නිවැරදිභාවය හෝ ඔවුන්ගේ සාධක කෙතරම් දුරට සනාථ කළ හැකි ද යන්න හෝ වැදගත් නො වෙයි. එහි දී අදාළ වන්නේ යම් පිරිසක් සමාජයට අවශ්‍ය ද නැත් ද යන්න ය.

මාර්ටින් වික්‍රමසිංහ මහතා මේ සම්බන්ධයෙන් ගෙනහැර දැක්විය හැකි හොඳ ම උදාහරණය වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි පොතපත කියැවූ ඔහු මුල් යුගයෙහි විසූ යථාර්ථවාදියෙක්, හේතුවාදියෙක් විය. ඔහුට බටහිර කෙටි කතාව හා නව කතාව මෙරට ප්‍රචලිත කිරමේ අවශ්‍යතාව ද විය. එහෙත් විසි වැනි සියවසේ දෙවැනි දශකයෙහි ද ඔහු මෙරට සමාජය විසින් පිළිගනු ලැබූ පුද්ගලයෙක් නො වී ය. සමාජය විසින් ඔහු පිළිගනු ලැබීමට පටන් ගැනුණේ විසිවැනි සියවසේ දශක කිහිපයක ඇවෑමෙන් ය. සමස්තයක් වශයෙන් ගත් කල දිගට ම එක ම දෙයක් කී අයකු එක් යුගයක පිළිගැනීමක් නො ලබන්නේත් තවත් යුගයක පිළිගැනීමක් ලබන්නේත් ඒ පුද්ගලයාගේ වර්ධනයක් නිසා නො ව ඒ අතරතුර කාලයෙහි ඇතිවන සමාජයීය වෙනස්කම් හේතු කොටගෙන ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva